# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-<br>2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1484 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 19/09/2024<br>පැය 0540 |


## මාධ්‍ය නිවේදනය

### 01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම - තංගල්ල පොලිස් වසම.

2024.09.18 වන දින රාත්‍රී කාලයේ තංගල්ල පොලිස් වසමේ දෙමටවල වත්ත පොල් ඉඩමක ළඟ කැලෑ ප්‍රදේශයේදී වෙඩි වැදීමක් හේතුවෙන් තුවාල ලැබූ පුද්ගලයෙකු තංගල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට තංගල්ල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 32 ක් වූ නලගම, විතාරන්දෙණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ගව පට්ටි පාලකයෙකු වන අතර, 2024.09.18 වන දින උදෑසන කාලයේ ගවයන් රැගෙන ඉහත ප්‍රදේශයට ගොස් ඇති අතර, නිවසට නොපැමිණීම හේතුවෙන් සිදුකළ සොයා බැලීමේදී, මරණකරු වෙඩි වැදුනු තුවාල සහිතව වැටී සිටිනු දැක රෝහල් ගත කර ඇත. මෙම ඝාතනයට හේතුව හෝ සැකකරුවන් සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු තොරතුරක් අනාවරණය වී නොමැත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මනුෂ්‍ය ඝාතනයක් - ගොඩකවෙල පොලිස් වසම.

2024.09.18 වන දින රාත්‍රී කාලයේ ගොඩකවෙල පොලිස් වසමේ ගල්පල්යාය ප්‍රදේශයේ දෙදෙනෙකු අතර ඇති වූ ආරවුලක් දුර දිග ගොස් සිදුකළ පහරදීමකින් පුද්ගලයෙකු තුවාල ලබා ගොඩකවෙල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ උඩුකුඹුර, හපුගස්තැන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සැකකරුගේ නිවස ආසන්නයට පැමිණ ආරවුලක් ඇති කරගෙන ඇති අතර, සැකකරු එම අවස්ථාවේදී බීමත්ව සිට ඇති බවට අනාවරණය වී ඇත. සැකකරු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා ගොඩකවෙල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගොඩකවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රාගම පොලිස් ස්ථානය.

2024.09.18 වන දින සවස් කාලයේ රාගම පොලිස් වසමේ උග්ගස්හේන ප්‍රදේශයේදී රාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 460 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.

2024.09.18 වන දින සවස් කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ 213 වත්ත ප්‍රදේශයේදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 330 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙමටගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.09.18 වන දින අළුයම් කාලයේ බොරැල්ල පොලිස් වසමේ සහස්පුර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 820 ක් සහ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 2 72,000/- ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.

2024.09.18 වන දින රාත්‍රී කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ බබාපුල්ල පාර ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 720 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.09.18 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. පුපුරණ ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නාඋල පොලිස් ස්ථානය.

2024.09.18 වන දින අළුයම් කාලයේ නාඋල පොලිස් වසමේ බිබිල ප්‍රදේශයේදී නාඋල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **සේවා නූල් සවි කරන ලද ඩෙටනේටර් 05 ක්, වෝටර් ජෙල් කූරු 03 ක් සහ වයර් රෝලක් ත්‍රිරෝද රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් 04 දෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 38, 49, 50 හා 65 වයස්වල පසුවන කටුගස්තොට, ගම්පොල, ඇළහැර හා උඩතලවින්න ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

නාඋල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - කාර්තිවු පොලිස් වසම.

2024.09.18 වන දින උදෑසන කාලයේ කාර්තිවු පොලිස් වසමේ අම්පාර කාර්තිවු මාර්ගයේ මාවඩිපල්ලි ප්‍රදේශයේදී සමන්තුරය දෙස සිට කාර්තිවු හන්දිය දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් එම දිශාවටම ධාවනය වූ යතුරු පැදියක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු සහ පසු පැදිකාරිය ලෙස සිටි පැදිකරුගේ දියණිය බරපතල තුවාල ලබා සමන්තුරය රෝහලට ඇතුලත් කිරීමේදී දියණිය මියගොස් ඇත.

**මියගිය දැරිය වයස අවුරුදු 14 ක් වූ සාලි පාර, සමන්තුරය 10 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය සමන්තුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කාර්තිවු පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - ඕමන්ත පොලිස් වසම.

2024.09.18 වන දින සවස් කාලයේ ඕමන්ත පොලිස් වසමේ වව්නියාව යාපනය මාර්ගයේ ඕමන්ත සමූපකාර ඉන්ධන පිරවුම් හල අසලදී යාපනය දෙස සිට වව්නියාව දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය අයිනේ නැවතී සිටි පාපැදිකරුවෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු, පසු පැදිකරු සහ පාපැදිකරු බරපතල තුවාල ලබා වව්නියාව රෝහලට ඇතුලත් කිරීමේදී යතුරු පැදිකරු සහ පාපැදිකරු මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 46 හා 48 වයස්වල පසුවන වට්ටකච්චි හා ඕමන්ත ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර වව්නියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඕමන්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - වේයන්ගොඩ පොලිස් වසම.

2024.09.18 වන දින සවස් කාලයේ වේයන්ගොඩ පොලිස් වසමේ වේයන්ගොඩ මීනුවන්ගොඩ මාර්ගයේ 20 කණුව අසලදී වේයන්ගොඩ දෙස සිට මීනුවන්ගොඩ දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය හරහා ගමන්කළ පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා වතුපිටිවල රෝහලටත්, පදික කාන්තාව බරපතල තුවාල ලබා මීනුවන්ගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී පදික කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 41 ක් වන වටද්දර, වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය මීනුවන්ගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වේයන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - කටුගස්තොට පොලිස් වසම.

2024.09.18 වන දින උදෑසන කාලයේ කටුගස්තොට පොලිස් වසමේ මහනුවර යාපනය ඒ 09 මාර්ගයේ කටුගස්තොට නගරයේදී කටුගස්තොට දෙස සිට මාතලේ දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගය හරහා ගමන්කළ පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා මහනුවර රෝහලට ඇතුලත් කර නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 71 ක් වන වත්තේගෙදර, පොල්ගොල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කටුගස්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**